# ඉරයි හඳයි
# වැහි වළාකුලයි
# වගේ



කෘතියේ නම

# ඉරයි හඳයි වැහි වළාකුලයි වාගේ

කතෘගේ නම

## එච්.ඒ. තරුෂි තෂ්මිලා ද අල්විස්

කෘතිය පළකරන දිනය

**2025.02.08**



*ISBN* අංකය

**9786242084985**

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග හැටි පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "මෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එකී විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදක්වන මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා ද අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සුභ උදෑසනක් යාලුවේ !
සුභ උදෑසනක් යාලුවේ !

"මොකද මේ ඉර යාළුවා දුර ගමනක්වත්ද?.
ඔව් යාලුවේ,

මම හිතුවේ වැසියාලුවාට මෙහෙ එන්න කියලා, මම අනික් ප්‍රදේශවලට යන්න කියලා........"



"අනේ ඉර යාලුවේ! මේ දවස් ටිකේනම් කොහෙවත් යන්න එපා.

ඇයි! වාළාකුලේ එහෙම කියන්නේ.

අනේ ඉර යාලුවේ! මේ දවස් ටිකේම වැස්ස,

ගං වතුර, නාය යෑම් වැනි බොහෝ දේවල් සිදු වෙනවා.

ඒ විතරක් නොවේ...........

පොඩි ළමයින්ට පාසල් යන්නත් විදියක් නෑ. මිනිසුන් පීඩා විදිනවා."



"අනේ මට සමාවෙන්න යාලුවේ!

මම මේවා ගැන දැනගෙන සිටියේ නෑ.

නෑ... කමක් නෑ.

එහෙනම් මම වැසි යාලුවාට කියන්නම් මෙහෙන් යන්න කියලා."



"ඇත්තටම මොකද්ද මෙතන උනේ වලාකුළේ. මේකයි.

ඒක දිග කතාවක්.

හරි මම කියන්නම් කෝ ......

එක දවසක් මම අහසේ පාවි පාවි ඉන්නකොට මගේ පිටුපසින් ඇවිත් කවුදෝ මට ගහන්න යනකොටම වැසි යාලුවා මැදට පැන්නා. ඊට පස්සේ එයාට ඒක වැදුනා."



“හැබැයි මම දැනන් හිටියේ නෑ කවුද මට පිටුපස්සෙන් ගහන්න ආවේ කියලා.

එයා මගේ හතුරෙක්.

එයා තමා හඳ යාලුවා.

එයා තමා මගේ පිටිපස්සෙන් මට ගහන්න ආවේ .”



“ඒ පහර තමා වැසියාලුවාට වැදුනේ.

ඉන්පසු වැහි වළාකුලට හොදටම රිදුනා. එයා හොදටම ඇඩුවා.”

හ.........

වළාකුල හුස්ම පහලට අරන් ආයෙමත් කතාව පටන්ගත්තා.

“ඉන් පසු ගංවතුර, නාය යෑම් වැනි දේවල් සිදුවුනා.”



"අනේ ඉර යාලුවේ!

වැහි යාලුවාට නම් බනින්න එපා .


ඇයි වළාකුලේ එහෙම කියන්නේ......

මම එහෙම කිවේ මා වෙනුවෙන් තමා එයා මැද්දට පැන්නේ.

ඒ හින්දා එයාට බනින්න එපා.

එයා ආයෙමත් අඬයි.

ආයෙමත් ගංවතුර ගලයි. නාය යෑම් වැනි දේවල් ආයෙමත් *සිදුවෙයි."*



"පොඩි ළමයින්ට ඉස්කෝලේ යන්නත් නෑ. පාසල් යට වෙලා, ගෙවල් යටවෙලා, ගෙවල් කඩා වැටෙනවා. එක එක හානි සිද්දවුණා.

අහෝ....! දෙවියනේ ..............!

මේ කොච්චර අපරාධයක්ද කරලා තියෙන්නේ.


මම අදම වැහි යාලුවයි, හඳ යාලුවයි හම්බ වෙනවා."



“හරි මට තේරෙනව වළාකුලේ.

හැබැයි හඳ යාලුවා වැරදි.

එයා එහෙම කරපු නිසානේ මෙහෙම දෙයක් වුනේ.”




"ඒක ඇත්ත ඉර යාලුවේ.

එයා එහෙම දෙයක් කරේ නැත්තම් මෙහෙම දෙයක් වෙන්නේ නෑ.

ඒක ඇත්ත වළාකුලේ.

එයා එහෙම කලේ නැත්නම් මේ විදිහට ප්‍රශ්න එන්නේ නෑ.

ඒක ඇත්ත ඉර යාලුවේ."



"මම එහෙනම් දැන්මම යනවා.

හරි...... පරිස්සමින් යන්න යාලුවේ. "


එයා යනකොටම ඩොක් ගාලා පැන්නා වළාකුල ඉර යාළුවාගේ ඇඟට.

ඉර යාළුවා බය වුණා,

"මේ.... මම හොඳටම බය වුණා.

ඇඟත් වෙව්ලනවා.

හරි හරි ඉර යාළුවා ආයේමත් එහේම කරන්නේ නෑ. විහිළුවක්නේ කළේ."



"හි...හි....හි........

ඔක හිනා වෙන්න දෙයක් නෙමෙයිනේ මෙතන වුණේ."

ඔහොම ඔහොම අන්තිමට හඳ යාළුවා හම්බ වෙන්න බැරි වුණා.

ඉතින් ඊළඟ දවසත් උදා වුණා.

ඒ දවසත් එයාලා දෙන්නා රණ්ඩු වුණා.



තුන්වන දවසත් උදා වුණා.

ඒ දවසත් රණ්ඩු වුණා.

හතරවෙනි දවසත් උදා වුණා.

ඒ දවසත් රණ්ඩු වුණා.

ඔහොම දවස් කිහිපයක් ගිහින් එත් මේ දෙන්නාගේ රණ්ඩුව නතර වෙන්නේ නැහැ.

මේ රණ්ඩුව දිගින් දිගටම ගියා. අන්තිමටම තරහා වුණා.



මේ දෙන්නා මාසයක් තරහා වෙලා හිටියා.

වළාකුල හම්බවෙන්න වැහිවළාකුල ආවා.

ඉතින් මෙයා ඇහුවා,

" වළාකුලේ ඇයි ඔයා තරහින් වගේ.....

ඔයා මාත් එක්ක තරහද?

නෑ.......

මම කාත් එක්කවත් තරහා නැහැ.

වැහිවළාකුල එහෙම කීවා."



"තරහා ඉරත් එක්ක.

වැහිවළාකුලේ ඒක දිග කථාවක් මම ඔයාට පස්සේ කියන්නම්.

වැහි යාළුවේ .

හරි පස්සේ කියන්න වළාකුළු  යාළුවේ.

මේ මම මෙහෙම අහැව්වේ අතන ඉර යාළුවා බලන් ඉන්න නිසා.

ඔයාම පොඩ්ඩක් බලන්නකෝ.

ආ...., මාත් දැක්කා.

අර ඉන්නේ. අර ඉන්නේ .....වළාකුලේ."



"හරි මම යන්නම්.......

මම පස්සේ වෙලාවක එන්නම්...

හරි වැහි වළාකුලේ.....

එහෙනම් ඔයා පරිස්සමින් ඉන්න."


ඊට පස්සේ මෙයා කල්පනා කරා ඉර යාළුවත් එක්ක යාළුවෙන්නේ කොහොමද කියලා.

හැබැයි මෙතන දන්නැති දෙයක් තියෙනවා.

ඒ තමයි වැසි යාළුවා කියන්නේ වළාකුළුයි ඉරයි මැව්ව චායාවක්

ඉතින් ඔහොම ඔහොම දවස් ගණන් ගියා.

දැන් ඔන්න අවුරුද්දකුත් ඉවරයි.



අන්තිමට මේ දෙන්නා යාළු වුණා.

ඉතින් ඊට පස්සේ ඒ දෙන්නා හිතුවා හඳ යාළුවා හම්බවෙන්න.

ඉතින් මේ දෙන්නා හඳ යාළුවා ඉන්න තැනට ගියා.

හඳ යාළුවාගෙන් එක එක ප්‍රශ්න ඇහුවා......

ඒ ඔක්කොටම හඳ යාළුවා උත්තර දුන්නා.

ඊට පස්සේ සමාව ඉල්ලුවා.

ආයෙත් හැමෝම යාළුවුණා.

ඊට පස්සේ සැම දේම හොඳින් සිද්ද වුණා.

ගොවිතැන් කටයුතු සරු වුණා.

හැම දෙනාම සතුටින් ජීවත් වුණා.

**නිමි.**

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔස්නැවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසත් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛක දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න
මහලේකම්